# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1580/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 16/12/2023<br>පැය 0745 |

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකාරියක් අත්අඩංගුවට - කහවත්ත පොලිස් ස්ථානය.**

2023.12.13 වන දින කහවත්ත පොලිස් වසමේ වැල්ලදුර ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් ගෙල කපා වයස අවුරුදු 71 ක් වූ වැල්ලදුර ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් ඝාතනය කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් කහවත්ත පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කර තිබිණි. විමර්ශන සිදුකර මෙම ඝාතනය සිදුකල මරණකාරියගේ දියණිය 2023.12.16 වන දින අළුයම් කාලයේදී කහවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 38 ක් වූ, වෙලේවත්ත, වැල්ලදුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අපරාධය සම්බන්ධයෙන් කහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**02. දේපල සොරකම් රාශියකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු හෙරෙ◌ායින් සමඟ අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2023.12.15 වන දින උදෑසන කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ කොරතොට හා වැලිහිඳ ප්‍රදේශවලදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 36 වයස්වල පසුවන අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී අතුරුගිරිය, කඩවත, තලංගම, කඩුවෙල සහ මාලඹේ යන පොලිස් වසම්වල සිදුකළ දේපල සොරකම් සහ කොල්ලකෑම් රාශියක් අනාවරණය වූ අතර, මෙම දේපල සොරකම් සහ කොල්ලකෑම් වලට සම්බන්ධ තවත් පසුව සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**සැකකරුවන් සොරකම් කරන ලද දේපලවලින් යතුරු පැදි 02ක්, රූපවාහිනී යන්ත්‍රයක්, ජංගම දුරකථන 03ක්, උණු කරන ලද රන් ගුලියක්, ගෑස් සිලින්ඩර් 02ක්,ටැබ් යන්ත්‍රයක්, විවිධ වර්ගවල ටයර් 09ක්, වයර් රෝල් 06 ක්, වාහන බැටරියක් ඇතුළු දේපල රාශියක් සොයා ගෙන ඇත. සැකකරුවන්ට අලුත්කඩේ සහ මහර ගරු මහේස්ත්‍රාත් අධිකරණ මගින් වරෙන්තුද නිකුත් කර ඇත.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාකරේ පොලිස් ස්ථානය.

2023.12.15 වන දින සවස් කාලයේ දී වාකරේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාකරේ පොලිස් වසමේ වම්බිවට්ටුවාන් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන වාකරේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාකරේ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**